# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1993 අංක 1 දරන
# උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 ජනවාරි මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 පෙබරවාරි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබා ගත හැක.

මිළ ශත 30 යි.    තැපැල් ගාස්තුව: රු. 1.00 යි.

# 1993 අංක 1 දරන උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 ජනවාරි මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 71/91

උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1993 අංක 1 දරන උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (110 වන අධිකාරය වන) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — 110 වන අධිකාරයේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

"6. (1) 5 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක බෙදා වෙන් කරනු ලැබ ඇත්තේ හෝ බෙදා වෙන් කරනු ලැබ ඇතැයි සලකනු ලැබ ඇත්තේ කවර කොට්ඨාස සඳහා ද ඒ එක් එක් (මෙහි මින්මතු "කොට්ඨාසය" යනුවෙන් සඳහන් කරනු ලබන) කොට්ඨාසය සඳහා නමින් හෝ ධුරයෙන්—

(අ) රෙජිස්ට්‍රාර්වරුන් සහ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරුන් එක් අයකු හෝ ඊට වැඩි ගණනක් ද ;

(ආ) නියමිත අවස්ථානුගත කරුණුවලදී සහ පත්වීමෙහි නිශ්චිතවම සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා වැඩබලන රෙජිස්ට්‍රාර්වරුන් සහ වැඩබලන නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරුන් එක් අයකු හෝ ඊට වැඩි ගණනක් ද

පත් කරනු ලැබිය හැකි ය.".

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**පාර්ලිමේන්තුවේ සිංහල පතත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ** අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන **එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැක.**